IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවණතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. (අ) කොටසේ ප්‍රශ්න තුනෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතු අතර (ආ) කොටසේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නවයකින් (09) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## (අ කොටස)

01. "2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය සියයට 3.9 (3.9%) කින් ඉහල ගිය අතර, එය 2019 වසරේ සමස්ත ශ්‍රම බලකා සහභාගීත්වය සියයට 56 (56%) ක වැඩිවීමකට දායක විය" (මහ බැංකු වාර්ෂික වාර්තාව, 2019). ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය ඉහල යාමේ ප්‍රතිවිපාක උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 25)

02. "ශ්‍රී ලාංකික පුහුණු වෘත්තිකයන් විදෙස් රටවලට සංක්‍රමණය වීම දිනෙන් දින ඉහල යාමක් පෙන්නුම් කරයි." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 25)

03. 2015 සැප්තැම්බර් මාසයේදී නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධාන ප්‍රධාන කාර්යාලයේදී එක් රැස් වූ ලෝක නායකයින් විසින් වසර 2000 දී හඳුන්වාදෙන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස, තිරසාර සංවර්ධන අභිමතාර්ථ දාහතක් (17) එළි දක්වන ලදී. මෙම තිරසාර සංවර්ධන අභිමතාර්ථ ලගා කර ගැනීමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග කවරේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 25)

## (ආ කොටස)

04. i. ආයතනික සමාජ වගකීම් යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. ආයතනික සදාචාරාත්මක හැසිරීම් තීරණය කරන සාධක කවරේද? ඉන් එක් (01) සාධකයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. "වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ආචාරධර්මද, සමාජයීය වගකීම් සංකල්පයේ කොටසක් ලෙස සලකන අතර සිය සාමාජිකයන් සඳහා ආචාර ධර්ම මාලාවක් (Code of Ethics) නිර්මාණය කිරීමට පෙළඹී සිටී." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? උදාහරණ යොදා ගනිමින් මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

05. i. වැඩවලදී "හිරිහැර" කිරීම යන්නෙන් කුමක් අදහස් වේද? නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. බියගැන්වීමේ පිරිවැය කවරේද? ඉන් එක් පිරිවැය තත්වයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. රැකියා ස්ථානයේ ඇතිවන අසතුටුදායක ගැටුම්, කළමනාකරණය කිරීම සඳහා ඔබට යොදාගත හැකි පෞද්ගලික ගැටුම් උපායමාර්ග කවරේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

06. i. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තිය තුල අන්තර්ගත කල හැකි නිරීක්ෂණ ක්‍රම (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

ii. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ වාසි සහ අවාසි සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. "ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේදී විවෘතභාවය යන පොදු මූලධර්මය ආරක්ෂා කිරීම වැදගත් වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

07. i. හැඟීම් ජනිතවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූලාශ්‍ර කවරේද? එක් එක් (01) මූලාශ්‍රයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 03)

ii. චිත්තවේගීය ශ්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි නිශේධාත්මක ප්‍රතිඵල හා සාධනීය ප්‍රතිඵල සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. Hochschild (1983) අනුව "චිත්තවේගීය ශ්‍රමය ඉටුකිරීමේ ප්‍රධාන ආකාර දෙක ලෙස මතුපිට ක්‍රියාකාරීත්වය හා ගැඹුරු ක්‍රියාකාරීත්වය දැක්විය හැක." මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

08. i. ශ්‍රම බලකා විවිධත්වය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. විවිධත්ව කළමනාකරණයේදී ආයතන මුහුණ දෙන ප්‍රධාන අභියෝග කවරේද? ඉන් එක් අභියෝගයක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. "ගෝලීයකරණයත් සමඟම බොහෝ ව්‍යාපාර සංවිධානවල ශ්‍රම බලකාය විවිධ සංස්කෘතීන් නියෝජනය කරන පුද්ගලයන්ගෙන් සමන්විත වී ඇති අතර ශ්‍රම බලකා විවිධත්වය කළමනාකරණයට උපක්‍රම සැකසීම කෙරෙහි ව්‍යාපාර තම අවධානය යොමුකර ඇත." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

09. i. රැකියා-ජීවිත සමබරතාව යන්නෙන් කුමක් අදහස්වේද? නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. රැකියා-ජීවිත සමබරතාව පවත්වා ගැනීම තුළින් ආයතනයට හා සේවකයාට ලබාගත හැකි ප්‍රයෝජන කවරේද?

(ලකුණු 04)

iii. ජීවන වියදම වැඩිවීමත් සමගම සැමියා මෙන්ම භාර්යාවද රැකියාවල නිරතවීම වර්තමානය වනවිට සුලභව දැකිය හැකි අතර බොහෝ ව්‍යාපාර සංවිධාන රැකියාවන්හි නිරතවන අතරතුර තම නිවෙසේ කාර්යභාරය ඉටුකිරීමට හැකිවන සේ වැඩසටහන් නිර්මාණය කරමින් සිටී. එවැනි වැඩසටහන් සඳහා උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

******